සියලු ම හිමිකම් ඇවිරිණි]
All Rights Reserved)

№ 20018

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව/Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, අගෝස්තු 1991
General Certificate of Education (Adv. Level) Examination, August 1991

(02) ව්‍යවහාරික ගණිතය I
(02) Applied Mathematics I

| 02 | |
|---|---|
| S | I |

පැ තුනයි / *Three hours*

ප්‍රශ්න හයකට පමණක් පිළිතුරු සපයන්න.

---

1. $O, A, B, C$ යනු $O, A, B$ ලක්ෂ්‍ය ඒක රේඛීය නොවන පරිදි වූ ප්‍රභින්න ලක්ෂ්‍ය හතරකි. $\alpha$ හා $\beta$ යනු නිශ්ශුන්‍ය සංඛ්‍යා විට $\overrightarrow{OA} = \mathbf{a}$, $\overrightarrow{OB} = \mathbf{b}$, $\overrightarrow{OC} = \alpha\mathbf{a} + \beta\mathbf{b}$ වේ.

   (i) $OA$ රේඛාව මත $D$ නම් ලක්ෂ්‍යයක් ගෙන ඇත්තේ $\overrightarrow{OD} = \gamma\mathbf{a}$ වන පරිදි ය. $\overrightarrow{DC} = \delta\mathbf{b}$ වන අයුරින් $\gamma$ හිත් $\delta$ හිත් අගයන් සොයන්න.

   (ii) $\alpha, \beta, \mathbf{a}$ හා $\mathbf{b}$ ඇසුරින් $\overrightarrow{AB}$ හා $\overrightarrow{AC}$ ප්‍රකාශ කරන්න. $\alpha + \beta = 1$ නම්, $A, B, C$ ලක්ෂ්‍ය ඒක-රේඛීය බව පෙන්වන්න. තව ද, $A$ ත් $B$ ත් අතර $C$ පිහිටන බව දී ඇති නම්, $\alpha$ ඇසුරෙන් පමණක් $AC : CB$ අනුපාතය ප්‍රකාශ කර, $0 < \alpha < 1$ බව අපෝහනය කරන්න.

   (iii) $P, Q$ යනු $\overrightarrow{OP} = 2\mathbf{a}$ ද $\overrightarrow{OQ} = \frac{2}{3}\mathbf{b}$ ද වන පරිදි වූ ලක්ෂ්‍ය දෙකකි. $AB$ හිත් $PQ$ හිත් ඡේදන ලක්ෂ්‍යය $R$_ය. $\mathbf{a}$ හා $\mathbf{b}$ ඇසුරෙන් $\overrightarrow{OR}$ ප්‍රකාශ කර, $AR : RB$ හා $PR : RQ$ යන අනුපාත සොයන්න.

2. (අ) $\mathbf{a}$ හා $\mathbf{b}$ යන නිශ්-ශුන්‍ය දෛශික දෙකේ $\mathbf{a}\cdot\mathbf{b}$ අදිශ ගුණිතය අර්ථ දක්වන්න. පහත සඳහන් ඒවා පිහිටුවන්න :

   (i) $(-\mathbf{a})\cdot\mathbf{b} = \mathbf{a}\cdot(-\mathbf{b}) = -\mathbf{a}\cdot\mathbf{b}$

   (ii) $\mathbf{a}$ හා $\mathbf{b}$ ලම්බ නම් ම පමණක් $\mathbf{a}\cdot\mathbf{b} = 0$

   $\mathbf{e}$ යනු ඒකක දෛශිකයක් නම් $\mathbf{e}\cdot\mathbf{b}$ ජ්‍යාමිතික ලෙස විවරණය කරන්න. $\mathbf{a}, \mathbf{b}$ හා $\mathbf{c}$ යන ඕනෑ ම දෛශික තුනක් සඳහා

   $$\mathbf{a}\cdot(\mathbf{b}+\mathbf{c}) = \mathbf{a}\cdot\mathbf{b} + \mathbf{a}\cdot\mathbf{c}$$

   බව පෙන්වන්න.

   (ආ) $ABC$ යනු ත්‍රිකෝණයකි. අදිශ ගුණිතය පිළිබඳ ගුණ භාවිත කර, $ABC$ ත්‍රිකෝණයේ, $A, B, C$ යන ශීර්ෂවල සිට පිළිවෙළින් $BC, CA, AB$ සම්මුඛ පාදවලට ඇඳි $AL, BM, CN$ ලම්බ ඒකලක්ෂ්‍ය වන බව පෙන්වන්න.

[ අනෙක් පිට බලන්න.

3. **a** හා **b** යන දෛශික දෙකකි **a** × **b** දෛශික ගුණිතය අර්ථ දක්වන්න.

*Oxyz* යනු සුරත් සෘජුකෝණාස්‍ර කාටීසිය ඛණ්ඩාංක පද්ධතියකි. **i**, **j**, **k** යනු පිළිවෙලින් *Ox*, *Oy*, *Oz* අක්ෂවල ධන දිශා ඔස්සේ වූ ඒකක දෛශික යි.

$\mathbf{i} \times \mathbf{i}$ සහ $\mathbf{k} \times \mathbf{j}$ සොයන්න.

*O* මූල ලක්ෂ්‍යය අනුබද්ධයෙන් *P*, *Q*, *R* ලක්ෂ්‍යවල පිහිටුම් දෛශික පිළිවෙලින්,

$$\mathbf{p} = 2\mathbf{i} - 3\mathbf{j} + \mathbf{k},$$
$$\mathbf{q} = \mathbf{i} - \mathbf{j} + 2\mathbf{k}$$
$$\mathbf{r} = -\mathbf{i} + 2\mathbf{j} + 3\mathbf{k}$$

වේ. *PQRS* සමාන්තරාස්‍රයක් වන පරිදි වූ *S* ලක්ෂ්‍යයේ **s** පිහිටුම් දෛශිකය සොයන්න.

තව ද

(i) $\overrightarrow{PQ} \times \overrightarrow{PS}$ ද

(ii) *PQRS* සමාන්තරාස්‍රයේ වර්ගඵලය ද

(iii) *PQRS* තලයට ලම්බ ඒකක දෛශිකය ද
සොයන්න.

4. බර *W* වූ ද *G* ගුරුත්ව කේන්ද්‍රයෙන් දණ්ඩ *a* හා *b* දිගැති කොටස් දෙකකට බෙදන්නාවූ ද *AB* දණ්ඩක දෙකෙළවරට $l\ (> a + b)$ දිග ලුහු අවිතන්‍ය තන්තුවක් ගැට ගසා තිබේ. තන්තුව, කුඩා සුමට *P* නාදත්තක් උඩින් යවා දණ්ඩ සමතුලිතතාවේ තබා ඇත.

(අ) (i) $A\hat{P}G = B\hat{P}G$ බව ද

(ii) $\cos A\hat{P}G = \dfrac{a+b}{2l}\left[\dfrac{l^2 - (a+b)^2}{ab}\right]^{\frac{1}{2}}$ බව ද

පෙන්වන්න.

(ආ) තන්තුවේ ආතතිය සොයන්න.

5. *n* ඒකතල බල පද්ධතියක *r* වැනි $(X_r, Y_r)$ බලය, තලයේ වූ *Oxy* සෘජුකෝණාස්‍ර කාටීසිය අක්ෂ අනුබද්ධයෙන් $A_r \equiv (x_r, y_r)$, $r = 1, 2 \ldots n$, ලක්ෂ්‍යයේ දී ක්‍රියා කරයි.

$P \equiv (x, y)$ ලක්ෂ්‍යය වටා බල පද්ධතියේ $G_P$ ඝූර්ණය,

$$G_P = G_O - xY + yX$$

යන්නෙන් ලැබෙන බව පෙන්වන්න. මෙහි

$$G_O = \sum_{r=1}^{n} (x_r Y_r - y_r X_r), \quad X = \sum_{r=1}^{n} X_r, \quad Y = \sum_{r=1}^{n} Y_r.$$

*ABC* ත්‍රිකෝණයේ *AB*, *BC* හා *CA* පාද පිළිවෙලින් $x + y = a$, $y - x = a$ හා $y = 2a$ මගින් දෙනු ලැබේ: මෙහි $a > o$. විශාලත්වය *R*, *R* හා *S* වූ ද පිළිවෙලින් *AB*, *BC* හා *CA* ඔස්සේ අක්ෂරවල පටිපාටියෙන් දක්වෙන අතට ක්‍රියා කරන්නා වූ ද බල තුනකින් හා ඝූර්ණය $2aS$ වූද *ABC* ත්‍රිකෝණයෙහි තලයේ *ACB* අභිදිශාවට] ක්‍රියා කරන්නා වූද යුග්මයකින් පද්ධතියක් සමන්විත වෙයි. $S \neq \sqrt{2}R$ නම් පද්ධතිය, තනි බලයකට ඌනනය වන බව පෙන්වා, එහි ක්‍රියා රේඛාවේ සමීකරණය සොයන්න.

$S = \sqrt{2}R$ විට කිමෙක් සිදු වෙයි ද?

6. එක එකක බර $W$ ද දිග $2a$ ද වන $AB$ සහ $AC$ සමාන, ඒකාකාර දඬු දෙකක් $A$ හි දී නිදහස් ලෙස සන්ධි කර, $B$ සහ $C$ දෙකෙළවර සුමට තිරස් මේසයක් මත පිහිටන සේ සිරස් තලයක තබා ඇත. සමතුලිතතාව පවත්වා ගන්නේ $C$ ලක්ෂ්‍යයත් $AB$ හි මධ්‍ය ලක්ෂ්‍යයත් යා කෙරෙන ලුහු අවිතන්‍ය තන්තුවක් මගිනි. එක් එක් දණ්ඩ තිරස සමඟ $\alpha \left( < \frac{\pi}{2} \right)$ කෝණයක් සාදයි. තන්තුවේ ආතතිය,

$$T = \frac{W}{4} \sqrt{1 + 9 \cot^2\alpha}$$

බව පෙන්වන්න.

$A$ සන්ධියේ ප්‍රතික්‍රියාවේ විශාලත්වයත් දිශාවත් සොයන්න.

7. ආධාරකයේ අරය $r$ ද අඩ සිරස් කෝණය $\alpha$ ද වන ඒකාකාර සෘජුවෘත්තාකාර ඝන, කේතුවක ගුරුත්ව කේන්ද්‍රය, ශීර්ෂයේ සිට $\frac{3}{4} r \cot \alpha$ දුරකින් අක්ෂය මත පිහිටන බව පෙන්වන්න.

ඒකාකාර සෘජුවෘත්තාකාර ඝන කේතුවක ඡින්නකයක, වෘත්තාකාර දෙකෙළවරේ අරයන් $a$ හා $\lambda a$ $(\lambda > 1)$ ද උස $h$ ද වෙයි. කුඩාතම ආධාරකයේ කේන්ද්‍රයේ සිට ඡින්නකයේ ගුරුත්ව කේන්ද්‍රයට දුර

$$\frac{h}{4} \left( \frac{3\lambda^2 + 2\lambda + 1}{\lambda^2 + \lambda + 1} \right)$$

බව පෙන්වන්න.

කුඩාතම ආධාරකයෙහි පරිධියේ වූ ලක්ෂ්‍යයකින් ඡින්නකය නිදහස් ලෙස එල්ලනු ලැබෙයි. සමතුලිතතා පිහිටීමෙ දී අක්ෂය, සිරසට $\alpha \left( < \frac{\pi}{2} \right)$ කෝණයෙකින් ආනත වෙයි. $\tan \alpha$ සොයන්න.

8.




ඉහත දැක්වෙන පරිදි $B$, $F$ හා $D$ සන්ධිවල දී භාරයන් යෙදූ ලුහු දඬුවලින් යුත් රාමු සැකිල්ලක් රූපයෙන් නිරූපණය වෙයි. $AC$ හා $CE$ තිරස් ය. ඒ එක එකක් මීටර 10 ක් දිග ය. $CF =$ මීටර 8 යි. තව ද $AB = BC = CD = DE$ වන අතර $BF = FD$ වේ. $A$ හිත් $E$ හිත් ප්‍රතික්‍රියා සිරස් යැයි උපකල්පනය කරමින් ඒවා ගණනය කරන්න.

$A$ සන්ධියෙන් ආරම්භ කර ප්‍රත්‍යාබල රූප සටහනක් අඳින්න. දඬුවල ප්‍රත්‍යාබල සොයා ඒවා ආතති ද තෙරපුම් ද යන වග නිශ්චය කරන්න.

9. බර $W$ වූ ද දිග $2a$ වූ ද ඒකාකාර $AB$ දණ්ඩක්, එහි $A$ කෙළවර රළු තිරස් පොළවකට ද $B$ කෙළවර රළු සිරස් බිත්තියකට ද හේත්තු වන සේ තිරසට $\alpha$ කෝණයකින් තබා ඇත. දණ්ඩ, බිත්තියට ලම්බ සිරස් තලයක පිහිටයි. $A$ හි දීත් $B$ හි දීත් ඝර්ෂණ සංගුණකය $\mu$ $( < 1 )$ වෙයි. දණ්ඩ සීමාකාරී සමතුලිතතාවේ පවතී නම්

$$\tan \alpha = \frac{1 - \mu^2}{2\mu}$$

බව පෙන්වන්න.

දණ්ඩේ තිරසට ආනතිය $\theta$ $( < \alpha )$ නම් ද දණ්ඩ පහළට ලිස්සා යාම යන්තම් වැළැක්වෙන පරිදි $M$ ඝූර්ණයෙන් යුත් යුග්මයක් දණ්ඩ හරහා යන සිරස් තලයේ යොදන්නේ නම් ද

$$(1 + \mu^2) M = (1 - 2\mu \tan \theta - \mu^2) Wa \cos \theta$$

බව පෙන්වන්න,

[ අනෙක් පිට බලන්න.

10. $ABCD$ සෘජුකෝණාස්‍ර ආස්තරයක්, ඝනත්වය $\rho$ වන සමජාතීය ද්‍රවයක ගිල්වා ඇත්තේ එහි ඉහළ $AB$ දාරය තිරස් ව ද $BC$ සිරස් ව ද පිහිටන පරිදි ය. $AB$ හි දිග $= b$ ද $BC$ හි දිග $= a$ ද වෙයි. $AB$ ඇත්තේ ද්‍රව පෘෂ්ඨයට පහළින් $h$ ගැඹුරකින් නම්, පීඩන කේන්ද්‍රය $AB$ ට පහළින්

$$\frac{a}{3}\,\frac{(2a + 3h)}{(a + 2h)}$$

ගැඹුරකින් පිහිටන බව පෙන්වන්න.

දැන් $AB$ පාදය ද්‍රව පෘෂ්ඨයට එන තෙක් $ABCD$ ආස්තරය සිරස් ලෙස ඔසවනු ලැබේ. $BD$ විකර්ණය වටා නිදහස් ලෙස හැරෙන්නට හැකි වන පරිදි ආස්තරය විවර්තනී කළ හොත්, එය $BD$ වටා භ්‍රමණය වීම වළක්වා-ලීමට අවශ්‍ය යුග්මයේ ඝූර්ණය

$$\frac{1}{12}\,\frac{a^3 b^2 \rho g}{\sqrt{a^2 + b^2}}$$

බව පෙන්වන්න.

11. උස $h$ ද සිරස් කෝණය $60°$ ද වන සෘජුවෘත්ත කේතුවක් ජලයේ ගිල්වා ඇත්තේ එහි ශීර්ෂය ජලය පෘෂ්ඨයේ පිහිටන ලෙසත් එහි අක්ෂය තිරස සමග $60°$ කෝණයක් සාදන ලෙසත් ය. කේතුවෙන් විස්ථාපනය වන ජලයේ බර $W$ නම්,

(i) කේතුවේ ආධාරකය මත තෙරපුම $\frac{3\sqrt{3}}{2}W$ බව ද,

(ii) කේතුවේ වක්‍ර පෘෂ්ඨය මත තෙරපුම $\frac{\sqrt{13}}{2}W$ බව ද,

පෙන්වන්න.

වක්‍ර පෘෂ්ඨය මත තෙරපුමේ දිශාව කිමෙක් ද?

12. ද්‍රවස්ථිති විද්‍යාවේ එන ආකිමිඩීස් මූලධර්මය ප්‍රකාශ කරන්න.

ඒකාකාර ඍජු ප්‍රිස්මයක හරස්-කඩ වනුයේ $ABC$ සෘජුකෝණික ත්‍රිකෝණයකි. එහි $AB = BC$. ප්‍රිස්මයේ විශිෂ්ට ගුරුත්වය $\sigma$ ($<1$) ය. $A$ ලක්ෂ්‍යය ඉහළින් ම පිහිටන සේ ප්‍රිස්මය ආංශික වශයෙන් ජලයේ ගිල්වා ඇත. ජල පෘෂ්ඨයෙහි අවල ව තබා ඇති $C$ හරහා යන දාරය වටා ප්‍රිස්මයට හැරෙන්නට නිදහස තිබෙයි. යටිඅත් සිරස සමඟ $BC$ හි ආනතිය $\theta$ නම්, සමතුලිතතා පිහිටීමේ දී $\theta$,

$$\cot^3\theta + (2 - \sigma)\cot\theta - 2\sigma = 0$$

සමීකරණය සපුරා-ලන බව පෙන්වන්න.

සියලු ම හිමිකම් ඇවිරිණි]
All Rights Reserved)

№ 20018

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව/Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 1991 අගෝස්තු
General Certificate of Education (Adv. Level) Examination, August 1991

| | |
|---|---|
| **(02) ව්‍යවහාරික ගණිතය II**<br>(02) Applied Mathematics II | **02**<br>**S \| II** |

පැය තුනයි/*Three hours*

ප්‍රශ්න හයකට පමණක් පිළිතුරු සපයන්න.

---

1. (i) $\dfrac{dy}{dx} = \dfrac{y(x-1)(y+2)}{x(y-1)(x+2)}$ අවකල සමීකරණය විසඳන්න.

(ii) $2x + 3y = u$ ආදේශය මගින්

$$\frac{dy}{dx} = \frac{2x + 3y + 4}{4x + 6y + 1}$$

අවකල සමීකරණය විසඳන්න.

(iii) $v$ යනු $x$ හි ශ්‍රිතයක් විට $y = vx$ ආදේශය මගින්

$$x\frac{dy}{dx} = y + x\cos\left(\frac{y}{x}\right)$$

අවකල සමීකරණය විසඳන්න.

2. සෘජු මාර්ගයක් ඔස්සේ ධාවනය කැරෙන බස් රථයක රියදුරෙක්, එයට ඉදිරියෙන් ඇති $H$ බස් නැවතුම් පොළේ බස් රථයට ගොඩ වීමට බලාපොරොත්තුවෙන් සිටින මගියකු දකියි. $AH =$ මීටර $a$ වන පරිදි වූ $A$ නම් ලක්ෂ්‍යයට එළැඹෙන විට බස් රථයේ ප්‍රවේගය $u$ m s$^{-1}$ විය. $H$ හි දී බස් රථය නවතින පරිදි $AB = BC = CH$ වන සේ වූ $A, B, C$ යන ලක්ෂ්‍යවල දී රියදුරා පිට පිට ම තිරිංග යොදයි. $AB$, $BC$ හා $CH$ ප්‍රාන්තවල දී, බස් රථයේ මන්දන පිළිවෙලින් $f$, $2f$ හා $3f$ m s$^{-2}$ වෙයි. බස් රථයේ චලිතය සඳහා ප්‍රවේග - කාල වක්‍රයක් අඳින්න. ඒ නයින් හෝ අන් අයුරෙකින් හෝ $f = \dfrac{u^2}{4a}$ බව පෙන්වන්න.

$B$ හා $C$ ලක්ෂ්‍ය වෙත පැමිණීමේ දී බස් රථයේ ප්‍රවේගය, $u$ ඇසුරෙන් සොයන්න. $A$ සිට $H$ තෙක් යාමට ගත වන මුළු කාලය,

$$\frac{4a}{u}\left[1 - \frac{(\sqrt{30} + \sqrt{2})}{12}\right]$$

බව පෙන්වන්න.

[ අනෙක් පිට බලන්න.

3. සරල රේඛාවක් දිගේ චලනය වන අංශුවක්, ඒකක ස්කන්ධයට $kv^3$ ප්‍රතිරෝධයකට භාජනය කෙරෙයි. මෙහි $v$ යනු අංශුවේ වේගය ද $k$ යනු නියතයක් ද වෙයි. අංශුව මත ක්‍රියා කරන එක ම බලය ප්‍රතිරෝධය නම් ගමන් කළ $x$ දුර ඇසුරෙන් $v$ ත් $t$ කාලයත් දෙනු ලබන්නේ

$$\frac{1}{v} = \frac{1}{u} + kx.$$

$$t = \frac{x}{u} + \frac{1}{2}kx^2,$$

සමීකරණ මගින් බව පෙන්වන්න. එහි $u$ යනු $t = 0$ මොහොතේ දී වේගය යි.

රයිෆලයක් යොදා ගෙන කරන ලද එක්තරා පරීක්ෂණයක දී, රයිෆලයේ කටෙන් උණ්ඩය නිකුත් වූයේ 800 m s$^{-1}$ වේගයෙන් බව ද මීටර 100 ක් ගමන් කළ පසු උණ්ඩයේ වේගය 780 m s$^{-1}$ තෙක් අඩු වූ බව ද නිමාණය කරන ලදී. උණ්ඩයේ චලිතයට ඇති වාත ප්‍රතිරෝධය $v^3$ ට සමානුපාතික වේ යැ යි උපකල්පනය කරමින් ද ගුරුත්වය නොසලකා හරිමින් ද මීටර 1 000 ක් ගමන් කිරීම සඳහා උණ්ඩයට ගත වන කාලය ආසන්න වශයෙන් තත්පර 1.41 ක් බව පෙන්වන්න.

4.




ඉහත රූප සටහනින් නිරූපණය වන්නේ, අචල සුමට තිරස් මේසයක් මත වන $m$ ස්කන්ධයෙන් යුත් $A$ වස්තුවත් $m'$ ස්කන්ධයෙන් යුත් $E$ අංශුවත් යා කෙරෙන $ABCDE$ ලුහු අවිතන්‍ය තන්තුව සමග කුඩා කප්පිවල සැකසුමකි. $B$ හා $D$ යන අචල සුමට කප්පි උඩින් තන්තුව යවා ඇත. $C$ යනු තන්තුවේ කොටස් දෙක මගින් දරා සිටින ස්කන්ධය $M$ වන චල සුමට කප්පියකි. තන්තුවේ $AB$ කොටස තිරස් වන අතර $BC$, $CD$ හා $DE$ කොටස් සිරස් ය. $t$ කාලයේ දී පිළිවෙලින් $AB$ හා $DE$ කොටස්වල දිග $x$ ද $y$ ද නම් $m$, $m'$ හා $M$ ස්කන්ධ සඳහා චලිත සමීකරණ ලියා දක්වන්න. තන්තුවේ $T$ ආතතිය

$$T\left[\frac{4}{M} + \frac{1}{m} + \frac{1}{m'}\right] = 3g$$

යන්නෙන් ලැබෙන බව අපෝහනය කරන්න.

ඒ නයින්

$$\frac{2}{M} = \frac{1}{m} + \frac{1}{m'}$$

නම් $C$ කප්පිය ස්ථාවර ව පවතින බව පෙන්වන්න.

5. ස්කන්ධය $M$ kg වන මෝටර් රථයක එන්ජිමක්, මෝටර් රථය චලනය වන විට බොට් $H$ නියත ජවයක් නිපදවයි. රථයේ චලිතයට ඇති ප්‍රතිරෝධය නියත යි. සමතල පාරක මෝටර් රථයේ උපරිම වේගය $V$ $\mathrm{m\,s^{-1}}$ ය.

(i) තිරසට $\alpha$ කෝණයකින් ආනත පාරක් දිගේ කෙළින් ම ඉහළවත්

(ii) $\sin\alpha < \dfrac{H}{MVg}$ වෙයි නම්, එම පාර දිගේ කෙළින් ම පහළවත්

චලනය වන විට මෝටර් රථයේ උපරිම වේගය සොයන්න.

ආනත පාරේ පහළට එන විට උපරිම වේගය, එම පාරේ ඉහළට යන විට උපරිම වේගය මෙන් දෙගුණයක් වෙයි නම් පාරේ තිරසට $\alpha$ ආනතිය, $\sin\alpha = \dfrac{H}{3\,MVg}$

යන්නෙන් ලැබෙන බව පෙන්වන්න.

මෝටර් රථය ආනත පාරේ පහළට චලනය වෙයි නම් ද එහි වේගය $V$ නම් ද රථයේ ත්වරණය කීයෙක් ද?

6. අභ්‍යවකාශයක්, පැය $T$ කාලයක ගමනක් (පියාසැරුමක්) සඳහා ප්‍රමාණවත් ඉන්ධන රැගෙන යයි. නිසල කාලගුණයක් තිබෙන විට එහි වේගය $u$ $\mathrm{km\,h^{-1}}$ ය. අභ්‍යවකාශයේ ගමන් (පියාසර) මඟ වෙනස් කිරීම සඳහා ගත වන්නේ නොගිණිය හැකි තරම් කාලයක් යැයි උපකල්පනය කරමින් උතුරේ සිට දකුණු දිශාවට $v\,(<u)$ $\mathrm{km\,h^{-1}}$ වේගයකින් හමන සුළඟක් ඇති විට, $\theta^\circ$ උතුරෙන් නැගෙනහිර දිශාවට අභ්‍යවකාශයේ ක්‍රියාන්විත පරාසය (පිටතට යාම හා ආපසු එම),

$$R = \frac{T}{2}\,\frac{(u^2 - v^2)}{\sqrt{(u^2 - v^2\sin^2\theta)}}$$

බව පෙන්වන්න.

$R$ පරාසය උපරිමයක් වන්නේ $\theta$ හි කවර අගයක් සඳහා ද ?

උපරිම පරාසයක් ලබා ගනු වස්, පිටතට පියාසැරුමේ දීත් ආපසු පියාසැරුමේ දීත් අභ්‍යවකාශය හැසිරවිය යුත්තේ කවර දිගංශවලින් ද?

7. සුමට ගෝලයක්, නිශ්චලතාවේ තිබෙන ඒ හා සමාන තවත් ගෝලයක් සමඟ ගැටීම වන්නේ, ගැටුම් මොහොතේ දී ඒවායේ කේන්ද්‍ර රේඛාව සමඟ $\theta$ කෝණයක් සාදන දිශාවකිනි. $e$ යනු ප්‍රත්‍යාගති සංගුණකය යි. චලනය වන ගෝලයේ චලිත දිශාව,

$$\tan\phi = \frac{(1 + e)\,x}{1 - e + 2x^2}$$

යන්නෙන් දෙනු ලබන $\phi$ කෝණයකින් අපගමනය වන බව පෙන්වන්න. මෙහි $x = \tan\theta$.

$\theta$ හි වෙනස් අගයන් සඳහා, $x = \sqrt{\dfrac{1 - e}{2}}$ විට $\phi_0$ උපරිම අපගමනය ඇති වන බව අපෝහනය කරන්න.

$\phi_0$ සොයන්න.

8. දුර පනින ක්‍රීඩකයකුට, පොළොවෙන් ඉවත් ව යන මොහොතේ දී (ඔහුගේ දිවීම නිසා) $u$ තිරස් ප්‍රවේගයකුත් සමඟ (ඔහුගේ පැනීම නිසා) තිරසට $\theta$ කෝණයකින් ආනත $\lambda u$ ප්‍රවේගයකුත් තිබේ. ඔහු පනින $l$ තිරස් දුර,

$$l = \frac{2u^2\lambda}{g}\,(1 + \lambda\cos\theta)\sin\theta$$

යන්නෙන් දෙනු ලබන බව පෙන්වන්න.

තව දුරටත් $\lambda = 1$ ද $l$ උපරිමයක් වන පරිදි $\theta$ තෝරා ගන්නේ ද නම් පැනීමේ දී ඔහු ළඟා වන වැඩි ම උස ආසන්න වශයෙන් $\dfrac{l}{7}$ ට සමාන බව පෙන්වන්න.

[ අනෙක් පිට බලන්න.

9. ස්වාභාවික දිග $a + b$ ද මාපාංකය $\lambda$ ද වන $AB$ ලුහු ප්‍රත්‍යාස්ථ තන්තුවක දෙකෙළවර, සුමට තිරස් මේසයක් මත $a + b$ දුරක පරතරයක් ඇති ව සවි කර තිබෙයි. $m$ ස්කන්ධයෙන් යුත් අංශුවක් $P$ ලක්ෂ්‍යයේ දී තන්තුවට ඈඳා ඇත්තේ අංශුව සමතුලිතතාවේ පවතින විට $AP = a, PB = b$ වන පරිද්දෙනි. අංශුව, $AQ = a + c$ වන පරිදි ඇති $Q$ ලක්ෂ්‍යයේ දී නිශ්චලතාවේ සිට මුදා හරිනු ලැබෙයි. එහි $0 < c < b$.

එය, $\pi \sqrt{\frac{m}{\lambda}} (\sqrt{a} + \sqrt{b})$ මුළු කාලයකට පසු ව $\frac{2c}{\sqrt{a}} (\sqrt{a} + \sqrt{b})$ මුළු දුරක් ගමන් කර $Q$ ලක්ෂ්‍යයට ආපසු පැමිණෙන බව පෙන්වන්න.

10. $A$ හා $B$ යනු $B$ ට ඉහළින් $A$ ද ඒවා අතර $c$ පරතරයක් ද තිබෙන සේ එක ම සිරස් රේඛාවේ පිහිටි අචල ලක්ෂ්‍ය දෙකකි. නිදහසේ චලනය විය හැකි $C$ නම් බර, කුඩා මුදුවක් තුළින් යැවූ ලුහු අවිතත්‍ය තන්තුවක් මඟින් එම ලක්ෂ්‍ය සම්බන්ධ කර තිබෙයි. $C$ මුදුව, $\omega$ නියත කෝණික වේගයක් ඇති ව $AB$ මත කේන්ද්‍රය පිහිටන තිරස් වෘත්තයක් සලකුණු කරන විට $A$ හිත් $B$ හිත් සිට $C$ ට දුර පිළිවෙළින් $b$ හා $a$ වෙයි. $b > a$ බවත් $\omega^2$ යන්න

$$(\cos A - \cos B)\, \omega^2 = g \left( \frac{1}{a} + \frac{1}{b} \right)$$

මඟින් දෙනු ලබන බවත් පෙන්වන්න. මෙහි $A$ හා $B$ මඟින් පිළිවෙළින් $B\hat{A}C$ හා $A\hat{B}C$ දක්වනු ලැබෙයි.
තව දුරටත්

$$\omega^2 = \frac{2gc}{b - a} \cdot \frac{a + b}{\{(a + b)^2 - c^2\}}$$

බව පෙන්වීමට $ABC$ ත්‍රිකෝණය සඳහා කෝසයින් සූත්‍රය භාවිත කරන්න.

11. දිග $a$ වන $OP$ ලුහු අවිතත්‍ය තන්තුවකට ගැට ගසා ඇති ස්කන්ධය $m$ වන $P$ අංශුවක්, තන්තුව ඇදී පවතිමින්, කේන්ද්‍රය $O$ වන පූර්ණ සිරස් වෘත්තයක භ්‍රමණය වෙයි. පහළ ම පිහිටීමේ දී $P$ හි ප්‍රවේගය $V$ නම් $OP$ රේඛාව යටි සිරස සමඟ $\theta$ කෝණයක් සාදන විට තන්තුවේ $T$ ආතතිය

$$T = \frac{m}{a} \left[ V^2 - 2ag + 3ag \cos \theta \right]$$

යන්නෙන් ලැබෙන බවත් $V^2 > 5ag$ බවත් පෙන්වන්න.

තව ද, ඉහළ ම පිහිටීමේ දී $P$ හි ප්‍රවේගය $\frac{V}{2}$ නම් $V$ නිර්ණය කර $P$ අංශුව පහළ ම පිහිටීමේ දී තන්තුවේ ආතතියේත් ඉහළ ම පිහිටීමේ දී තන්තුවේ ආතතියේත් අනුපාතය 19 : 1 බව පෙන්වන්න.

12. ස්කන්ධය $M$ ද දිග $a$ ද වන $OA$ ඒකාකාර දණ්ඩක, $O$ කෙළවර හරහා දණ්ඩට ලම්බ අක්ෂයක් වටා අවස්ථිති ඝූර්ණය $\frac{1}{3} Ma^2$ බව පෙන්වන්න.

දණ්ඩ, $O$ අචල කෙළවර වටා $\omega$ කෝණික ප්‍රවේගයෙන් සුමට තිරස් මේසයක් මත වෘත්ත සලකුණු කරයි. $O$ සිට $b$ දුරක තිබෙන $m$ ස්කන්ධයෙන් යුත් අංශුවක් දණ්ඩ හා ගැටී දණ්ඩ තුළට කාවදියි. එවිට කෝණික ප්‍රවේගය

$$\frac{M a^2 \omega}{Ma^2 + 3mb^2}$$ තෙක්

අඩු වන බව පෙන්වන්න.

$Ma^2 = 3mb^2$ නම් ගැටුම නිසා සිදු වන චාලක ශක්තියේ හානිය $\frac{1}{12} Ma^2\omega^2$ බව පෙන්වන්න.